චක්‍රලේඛ අංක. PS/ADA/Circular /13/2025
2025 නොවැම්බර් 14 වන දින

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීම සඳහා වන "රටම එකට ජාතික මෙහෙයුම" වැඩසටහන යටතේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මෙහෙයුම් සභා ස්ථාපිත කිරීම

ප්‍රවේශය

රටක් සතු වටිනාම සම්පත් වන රටේ දරු පරපුර හා තරුණ පරපුර ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වන භයානක ව්‍යසනයක් ලෙස විෂ මත්ද්‍රව්‍ය ජාවාරම පෙන්වා දිය හැකිය. එමඟින් රටක අනාගතය මුළුමනින්ම විනාශය කරා රැගෙන යාමේ බරපතළ අවදානමක්ද උද්ගත වේ. දේශීය හා ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධ ජාලයන් මඟින් මෙහෙයවෙන මෙම ව්‍යසනය පුළුල් ජාතික ප්‍රවේශයක් තුළින් මුලිනුපුටා දැමිය යුතු තීරණාත්මක මංසන්ධියකට රටක් වශයෙන් අපි පැමිණ සිටිමු.

ඒ අනුව, මේ සඳහා පිළියමක් වශයෙන් අමප /25/1937/801/026 අංක දරන 2025.10.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීම සඳහා වන "රටම එකට ජාතික මෙහෙයුම" වැඩසටහන ගරු ජනාධිපතිතුමා විසින් හඳුන්වා දෙනු ලැබ ඇත. විෂ මත්ද්‍රව්‍ය ගෙන්වන්නන් හා බෙදාහරින්නන් ඇතුළු මත්ද්‍රව්‍ය ජාවාරමේ නිරත පිරිස් නීතියේ රැහැනට හසු කරගැනීම හා හුදෙකලා කිරීමත්, විෂ මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ පිරිස් එම විනාශකාරී ඇබ්බැහියෙන් මුදවා ගෙන පුනරුත්ථාපනය කිරීමත් එමඟින් අපේක්ෂා කෙරේ.

"මතින් තොර රටක් - සතුටින් පිරි හෙටක් " නිර්මාණය කිරීම දැක්ම කරගත් මෙම වැඩසටහන මඟින් විෂ මත්ද්‍රව්‍ය ව්‍යසනයට එරෙහිව දැවැන්ත සමාජ බලපෑමක් හා පීඩනයක් ගොඩනැඟීම සඳහා රජය, ආරක්ෂක අංශ, සිවිල් සංවිධාන හා සමස්ත පුරවැසියන්ගෙන් ඒකාබද්ධ වූ පුළුල් මහජන සහභාගීත්වයක් සහිත ජාතික වැඩසටහනක් නිර්මාණය කරමින් පහත සඳහන් නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ:

i. ජාවාරම්කරුවන් හා බෙදාහරින්නන් නීතියේ රැහැනට හසු කරගැනීම හා හුදෙකලා කිරීම.
ii. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් පුනරුත්ථාපනය කිරීම හා ප්‍රතිකාර සඳහා යොමු කිරීම
iii. ජාතික, දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
iv. "ඉවත් වෙනු" යන තේමාව ඔස්සේ පුළුල් ප්‍රචාරණ ක්‍රියාවලියක් මඟින් සමාජ දැනුවත්භාවය සඳහා අවශ්‍ය සංවිධාන යන්ත්‍රණය ශක්තිමත් කිරීම

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ජාතික මෙහෙයුම් සභාවක් දැනටමත් ස්ථාපිත කර ඇති අතර, එහි දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මෙහෙයුම් සභා ස්ථාපිත කිරීම හරහා රජය සහ මහජනතාව වඩාත් සමීපව ඒකාබද්ධ කරමින් විෂ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීමේ ජාතික මෙහෙයුමේ ඉදිරි කාර්යයන් සැලසුම් කර කඩිනමින් ක්‍රියාවට නැංවීමට අපේක්ෂිතය.

01. දිස්ත්‍රික් මෙහෙයුම් සභාව

1.1 මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් සෑම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් මෙහෙයුම් සභාවක් ස්ථාපිත කළ යුතුය. එහි සංයුතිය **ඇමුණුම 1** මඟින් දැක් වේ. දිස්ත්‍රික් මෙහෙයුම් සභාවේ කාර්යභාරය ජාතික වැඩසටහනේ අරමුණුවලට ගැළපෙන පරිදි සහ ජාතික මෙහෙයුම් සභාවේ කාර්යභාරයට අනුරූප වන පරිදි එක් එක් දිස්ත්‍රික්කයන්හි අවශ්‍යතාවන් සැලකිල්ලට ගෙන තීරණය කරගත යුතුය. විශේෂයෙන්ම, දිස්ත්‍රික් මට්ටමේ නායකත්වය සහ මහපෙන්වීම ලබා දෙමින් ජාතික මෙහෙයුම් සභාව විසින් සැලසුම් කරනු ලබන වැඩසටහන් දිස්ත්‍රික්ක මට්ටමින් ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් මෙහෙයුම් සභාවෙන් අපේක්ෂා කෙරේ.

02. ප්‍රාදේශීය මෙහෙයුම් සභාව

2.1 ප්‍රාදේශීය මෙහෙයුම් සභාව, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් ස්ථාපිත කළ යුතුය. එහි සංයුතිය **ඇමුණුම 2** මඟින් දැක්වේ. ප්‍රාදේශීය මෙහෙයුම් සභාවේ කාර්යභාරය ජාතික වැඩසටහනේ අරමුණුවලට ගැළපෙන පරිදි සහ දිස්ත්‍රික් මෙහෙයුම් සභාවේ කාර්යභාරයට අනුරූප වන පරිදි ප්‍රාදේශීය අවශ්‍යතාවන් සැලකිල්ලට ගෙන තීරණය කරගත යුතුය. විශේෂයෙන්ම, ප්‍රාදේශීය මට්ටමේ නායකත්වය සහ මහපෙන්වීම ලබා දෙමින් ජාතික මෙහෙයුම් සභාව සහ දිස්ත්‍රික් මෙහෙයුම් සභාව විසින් සැලසුම් කරනු ලබන වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය මෙහෙයුම් සභාවෙන් අපේක්ෂා කෙරේ.

2.2 තවද, 14,000කට අධික වූ ග්‍රාම නිලධාරී කොට්ඨාස ආවරණය වන පරිදි මහජන ආරක්ෂක කමිටු දැනටමත් පිහිටුවා ඇති අතර, එම ව්‍යූහය ඔස්සේ මෙම වැඩසටහන ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක කළ යුතු වේ.

2.3 මෙයට අමතරව "රටම එකට ජාතික මෙහෙයුම" මහජනතාව අතරට ගෙන යාම සඳහා සන්නාම තානාපතිවරුන් සහ ප්‍රකාශකයින්ගෙන් සමන්විත ව්‍යූහයක්ද සකස් කෙරෙනු ඇත.

03. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මෙහෙයුම් සභාවල කටයුතු

3.1. වර්ෂය ආරම්භයේ පළමු සති දෙක තුළ දිස්ත්‍රික් ලේකම් විසින් එම වර්ෂයට අදාළව දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මෙහෙයුම් සභා පැවැත්වීම සඳහා තාවකාලිකව සැලසුම් කළ දිනයන් පිළිබඳ තොරතුරු මහජන ආරක්ෂාව විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කළ යුතුය. සැලසුම් කළ පරිදි දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මෙහෙයුම් සභා රැස්වීම් පැවැත්විය යුතු අතර, මෙහෙයුම් සභා සාමාජිකයන්ට සැලසුම්සහගතව සහ ඵලදායී ලෙස එම රැස්වීම්වලට සහභාගී වීමට ඉඩ සැලසෙන පරිදි රැස්වීම පැවැත්වෙන දිනය අවම වශයෙන් දින 07කට පෙර දැන්විය යුතුය.

3.2. දිස්ත්‍රික්/ප්‍රාදේශීය මෙහෙයුම් සභාවේ සභාපති විමසා දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් විසින් න්‍යාය පත්‍රය සකස් කළ යුතු අතර, එහි කටයුතු විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීමට අදාළ කාර්යයන් සඳහා සීමා විය යුතුය.

3.3. ඒ ඒ දිස්ත්‍රික්කයේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවශ්‍යතාවන් සලකා මෙහෙයුම් සභා සභාපතිවරුන් විසින් අනුකමිටු (ආරක්ෂක, ආගමික, සමාජීය වැනි) පත් කළ හැකි අතර, එම සංඛ්‍යාව උපරිම 03කට සීමා විය යුතුය.

3.4. දිස්ත්‍රික් / ප්‍රාදේශීය මෙහෙයුම් සභා සිය කර්තව්‍යයන් ඉටු කිරීමේදී රජයේ අණපනත් සහ චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

3.5. දිස්ත්‍රික්/ප්‍රාදේශීය මෙහෙයුම් සභාවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පහත කරුණුවලට අදාළව පරිපාලන තීරණ ගැනීමේ බලය සහ ඒ සඳහා ක්‍රමවේද සකස් කර ගැනීමේ බලය මෙහෙයුම් සභාවට පැවරෙන අතර, එම ක්‍රමවේද ජනාධිපති කාර්යාලයට සහ මහජන ආරක්ෂාව විෂය භාර අමාත්‍යාවරයා වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය .

i. රැස්වීමේ කාලය
ii. මෙහෙයුම් සභාව සඳහා අත්‍යවශ්‍ය නොවන නිලධාරීන් නොකැඳවීම
iii. න්‍යාය පත්‍රය අනුව ඒ ඒ නිලධාරීන් සභා රැස්වීමේ රැඳී සිටිය යුතු කාලය තීරණය කිරීම
iv. මාර්ගගත ක්‍රමයට සාමාජිකයන් සම්බන්ධ කරගැනීම
v. පරිබාහිර පුද්ගලයන් සම්බන්ධ කරගැනීම හා එම පිරිස් රැස්වීමේ සාකච්ඡා කාලය තුළ රඳවා ගැනීම/නොගැනීම.
vi. සාකච්ඡා සටහන් ආකෘතිය සහ ප්‍රගති සමාලෝචන ක්‍රමවේදය

3.6. රැස්වීමේ සියලු වාර්තා ලිඛිතව හා පටිගත කර තබාගැනීමේ වගකීම දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් සතු වේ. රැස්වීමේ සාකච්ඡා සටහන, රැස්වීමේදී ගනු ලැබූ තීරණයන්ට අදාළ නිශ්චිත ආයතන වෙත දෘඪ/මෘදු පිටපතක් ලෙස රැස්වීම පවත්වා දින 03ක් තුළ යොමු කළ යුතුය. එසේම එහි පිටපත් ජනාධිපති කාර්යාලයට සහ මහජන ආරක්ෂාව විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙතද යොමු කළ යුතුය.

3.7. රැස්වීමේ කරුණු වාර්තා කිරීමට මාධ්‍යවේදීන්ට අවසර ඇති අතර , අවශ්‍ය නම් රැස්වීම අවසානයේ දිස්ත්‍රික්/ප්‍රාදේශීය මෙහෙයුම් සභා සභාපතිවරුන්ට මාධ්‍ය සමඟ වෙනම සාකච්ඡාවක් පැවැත්විය හැකිය.

3.8. සිද්ධීන්ට හා පුද්ගලයින්ට අදාළ සංවේදී තොරතුරු මෙන්ම තොරතුරු ලබා දෙන්නන්ගේ අනන්‍යතාවට අදාළ කරුණු ප්‍රසිද්ධියේ සාකච්ඡා නොකළ යුතුය.

04. දිස්ත්‍රික්/ප්‍රාදේශීය මෙහෙයුම් සභා අධීක්ෂණය

4.1. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මෙහෙයුම් සභා අධීක්ෂණය සහ පහසුකම් සැලසීම ජනාධිපති කාර්යාලය සහ මහජන ආරක්ෂාව විෂය භාර අමාත්‍යාංශය විසින් ඒකාබද්ධව සිදු කරනු ලැබේ .

05. දිස්ත්‍රික්/ප්‍රාදේශීය මෙහෙයුම් සභා සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම

5.1. විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීම සඳහා වන "රටම එකට ජාතික මෙහෙයුම" දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාවට නංවනු ලබන ප්‍රධානතම යන්ත්‍රණය දිස්ත්‍රික්/ප්‍රාදේශීය මෙහෙයුම් සභා වන බව අවධාරණය කරන අතර, එම සභාවල සාමාජිකයන් එහි කටයුතුවලට සක්‍රීය දායකත්වය ලබා දිය යුතු වේ. ඒ අනුව, දිස්ත්‍රික්/ප්‍රාදේශීය මෙහෙයුම් සභා විසින් ගනු ලබන නීත්‍යානුකූල තීරණ ක්‍රියාත්මක කිරීමට සෑම රාජ්‍ය නිලධාරියෙකුම පූර්ණ වශයෙන් බැඳී සිටී.

5.2. දිස්ත්‍රික්/ප්‍රාදේශීය මෙහෙයුම් සභා සඳහා කැඳවීමක් ලද සෑම රාජ්‍ය නිලධාරියෙක්ම ඒ සඳහා අනිවාර්යයෙන් සහභාගී විය යුතු අතර, එලෙස සහභාගී වීමට නොහැකි නම් ඒ බව මෙහෙයුම් සභාවේ ලේකම් වෙත පූර්වයෙන් දැනුම් දී ඒ සඳහා සුදුසු වැඩපිළිවෙළක් යෙදිය යුතුය.

06. මෙම වැඩසටහන සඳහා 2025 වසර සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ක්ලීන් ශ්‍රී ලංකා **(Clean Sri Lanka)** වැඩසටහන මඟින් සලසා දී ඇති අතර, 2026 වසරේ සිට ඉදිරියට වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කෙරෙනු ඇත.

07. රජය විසින් වරින් වර පනවනු ලබන යම් යම් නීතිරීතිවලට හෝ නියෝගවලට අනුව මෙම වක්‍රලේඛයේ කරුණුවලට සංශෝධන ඇතුළත් කිරීම පිළිබඳ ඔබ වෙත අදාළ පරිදි දන්වනු ලැබේ.

08. මෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් විමසීම් / පැහැදිලි කිරීම් හෝ වෙනත් අදාළ තොරතුරු ලබා ගැනීම අවශ්‍ය වේ නම් ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, කේ.එල්.ඩී. අසේල මහතා (දුරකතන අංක : 0112354354 - දිගු අංකය 3606 / විද්‍යුත් තැපෑල **sas6.ada@presidentsoffice.lk**) ඔස්සේ සම්බන්ධ කරගත හැකිය.

09. අප රට, වර්තමානයේ මුහුණ පා සිටින මෙම ජාතික ව්‍යසනයෙන් මුදවා ගනිමින්, අප සැමගේම ප්‍රාර්ථනාව වන සුන්දර ශ්‍රී ලංකාවක් නිර්මාණය කර ගැනීමේ මෙම මාහැඟි ජාතික මෙහෙවර සඳහා ඔබගේ සක්‍රීය සහභාගීත්වය, දායකත්වය, කැපවීම සහ සහයෝගීතාව අපේක්ෂා කරමි.

ආචාර්ය එන්. එස් කුමානායක
ජනාධිපති ලේකම්
දුරකථන : +94 11 3254420 ෆැක්ස් : +94 11 2446657
විද්‍යුත් තැපෑල :- **prsec@presidentsoffice.lk**

පිටපත්: 1. සියලුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්
2. සියලුම පළාත් ආණ්ඩුකාරවරුන්
3. අග්‍රාමාත්‍ය ලේකම්
4. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන ආමාත්‍යාංශය
5. විගණකාධිපති
6. අධ්‍යක්ෂ ජනාරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
7. රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

දිස්ත්‍රික් මෙහෙයුම් සභාවේ සංයුතිය

මහජන නියෝජිතයින් හා නිලධාරීන්

1. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති - සභාපති
2. ගරු ආණ්ඩුකාරවර
3. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු
4. පළාත් ප්‍රධාන ලේකම්
5. දිස්ත්‍රික් ලේකම්/දිසාපති - දිස්ත්‍රික් මෙහෙයුම් සභාවේ ලේකම්
6. පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු
7. පළාත් පාලන කොමසාරිස්
8. පළාත් පරිවාස කොමසාරිස්
9. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
10. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
11. පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
12. දිස්ත්‍රික්කය භාර නියෝජ්‍ය පොලිස්පති / කොට්ඨාස භාර නිලධාරීන්
13. දිස්ත්‍රික්කය භාර ප්‍රධාන ආරක්ෂක අංශ නිලධාරීන් - ත්‍රිවිධ හමුදාව
14. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්
15. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ දිස්ත්‍රික් නිලධාරීන්
16. පුනරුත්ථාපන කාර්යාංශයේ නිලධාරීන්
17. ප්‍රජා විශෝධන නිලධාරීන්

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිගේ එකඟතාව සහිතව කැඳවිය යුතු පිරිස්

1. සියලුම ආගමික නායකයින්
2. සිවිල් සංවිධාන නියෝජිතයින්
3. විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් නියෝජිතයින්
4. පෞද්ගලික පුනරුත්ථාපන ආයතනවල නිලධාරීන්

ප්‍රාදේශීය මෙහෙයුම් සභාවේ සංයුතිය

මහජන නියෝජිතයින් හා නිලධාරින්

1. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති - සභාපති
2. ප්‍රාදේශීය ලේකම් - ලේකම්
3. පළාත් පාලන ආයතන ප්‍රධානීන්
4. පළාත් පාලන ආයතනවල සභිකයන්
5. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
6. රෝහල් අධ්‍යක්ෂ/වෛද්‍ය අධිකාරි
7. පොලිස් ස්ථානාධිපතිවරුන්
8. සෞඛ්‍ය සේවා නිලධාරින්
9. පරිවාස නිලධාරීන්
10. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින්
11. ළමා ආරක්ෂණ නිලධාරින්
12. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රාදේශීය නිලධාරීන්
13. ස්ථාන භාර නිලධාරි - ජාතික යොවුන් සේනාංකය
14. ස්ථාන භාර නිලධාරි - ජාතික වෘත්තීය පුහුණු අධිකාරිය/විදුහල්පති - කාර්මික විද්‍යාලය
15. තරුණ සේවා නිලධාරින්
16. සුරාබදු අධිකාරි
17. ප්‍රජා විශෝධන නිලධාරි
18. මහජන ආරක්ෂක කමිටුවල සභාපතිවරුන්

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිගේ එකඟතාව සහිතව කැඳවිය යුතු පිරිස්

1. සියලුම ආගමික නායකයින්
2. සිවිල් සංවිධාන නියෝජිතයින්
3. විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් නියෝජිතයින්